විජයබා පිරිවෙන හා අද සරසවිය

සිසු සිසුවිය මන දමනිය තුරුණු   විය
මෙහෙයවිය නැණ ගිහිනය සිය   දිවිය
සවි සදවිය ලද උදවිය දෙන   සවිය
මිතු පරෙවිය බල කැලණිය   සරසවිය

ගෙල දරු දරිවියන් වියතුන් කරන   සබේ
දෙගන ඇතන් මෙහි ගුව්කෙලි මැවෙති   ඉබේ
සොත පත සේම සොඳු මුගුරු ද කඩුද   තිබේ
වසරට දස වරක්වත් මෙය වියනු   ලැබේ

මවිසින් රචිත 'නූතන පරෙවි සන්දේශය' නමැති පොතේ කැලණි විශ්වවිද්‍යාලය මගින් පියාසර කරන පරෙවියාට කියූ ඉහත සඳහන් එම කවි දෙක උපුටා දක්වමින් මෙම ලිපිය ආරම්භ කිරීමට සිතුවෙමි. අද අප රටේ විශ්වවිද්‍යාල වැටී ඇති අඳුරු අගාධය පිළිබඳව කල්පනා කරන විට අප පොත පතින් උගත්, පහළොස්වන සියවසේ විරාජමානව තිබූ, ගාලු දිස්ත්‍රික්කයේ, තොටගමුවේ, විජයබා පිරිවෙන සිහියට නැගේ. රටක අනාගතය භාර ගැනීමට සිටින, රටේ ජීවනාලිය බඳු, උගත් තරුණ තරුණියන් හට උසස් අධ්‍යාපනය ලබාදෙන, වෙනත් රටවල විශ්වවිද්‍යාලයන්, ඉතා ම ක්‍රමානුකූලව විෂය නිර්දේශයන් ක්‍රියාත්මක කරවමින්, නියමිත කාලසටහනකට අනුව විභාග පවත්වමින් සිසුනට තම අනාගත කටයුතු නියමාකාරයෙන් සැලසුම් කිරීමට හැකිවන පරිදි කටයුතු මෙහෙයවද්දී, අප විශ්වවිද්‍යාලවල සිසු සිසුවියන් බහුතරයක් තම විශ්වවිද්‍යාල විවෘතව තිබේ නම් කවද වැසේද, වැසී තිබේ නම් කවද විවෘත වේද, විභාග කල් යයිද කවද පවත්වයිද යන්න පිළිබඳ මහත් වූ විචිකිච්ඡාවකින් හා ව්‍යාකූල වූ මනසකින් යුතුව තම ඉදිරිය සැලසුම් කිරීමට නොහැකිව කල් ගෙවති. එබඳු වූ පරිසරයක ඉගැන්වීම් කටයුතු පිළිබඳව සහ එහි ගුණාත්මක භාවය පිළිබඳව කවර නම් කතාද?

රටේ වර්තමාන විශ්වවිද්‍යාල, සිසුන්ගේ හැසිරීම් තුළින් එවන් වූ අපකීර්තිමත් සහගත තත්ත්වයකට වැටී තිබුණද, 15 වන සියවසේ ජාත්‍යන්තරයේ පවා කීර්තියට පත් වූ සරසවියකි විජයබා පිරිවෙන. වර්ෂ 1916 ජනවාරි 14 වන දින ශ්‍රීමත් පොන්නම්බලම් අරුණාචලම් මහතා (1853-1924) කල්කටා විශ්වවිද්‍යාලයේ පෙරදිග හා අපරදිග විද්වතුන්ගේ සමුළුවක් අමතන අවස්ථාවේදී කරන ලද ප්‍රකාශයක් මෙහිදී දක්වීම වටී. 'බටහිර රටවල්වල විශ්වවිද්‍යාල බිහිවීම හා වර්ධනය වීම ආරම්භ වූයේ 18 වන ශතවර්ෂයේ වූ නමුත් ඊට බොහෝ කලකට පෙර, එනම් 15 වන ශත වර්ෂයේදී ලංකාවේ තොටගමු නම් පෙදෙසේ ශ්‍රී රාහුල හිමියන් යටතේ පරිපූර්ණ විශ්වවිද්‍යාලයකට සමාන අධ්‍යාපනික ආයතනයක් පැවතුණි' යන්නයි. විජයබා පිරිවෙන ශ්‍රේෂ්ඨ ආයතනයක් බවට පත් කිරීමට පෙර එහි අධිපතිත්වය දැරූ ශ්‍රේෂ්ඨ භික්ෂු පඬිවරුන් නිසි අඩිතාලම දමා තිබුණ ද එය ජාත්‍යන්තර තලයට ගෙනැවිත් දකුණු ආසියාවේ බැබළෙන අධ්‍යාපන පීඨයක් බවට පත් කරලීමේ ගෞරවය හිමි විය යුත්තේ තොටගමුවේ සිරි රහල් හිමියන්ට බැව් නොරහසකි.

විශ්වවිද්‍යාලයක කීර්තිය ඉසිලූ, බොහෝ ලෞකික විෂයයන් හැදෑරීමට ඉඩ ප්‍රස්ථාව ලබාදුන් විජයබා පිරිවෙනේ අධ්‍යාපනය හැදෑරීමට ඉන්දියාවේ බ්‍රාහ්මණ තරුණයන් ද ඇතුළුව බොහෝ ශිෂ්‍යයන් පැමිණ තිබේ. රාහුල හිමියගේ නායකත්වය දැරූ විජයබා පිරිවෙනෙහි විෂය මාලාවට, සමකාලීන කැරගල විද්‍යාපීඨයේ විෂය මාලාවට වඩා, බොහෝ විවිධ ක්ෂේත්‍රයන්හි විෂයයන් අඩංගු විය. සමකාලීන සාහිත්‍ය කෘතියක් වූ ගිරා සංදේශයෙහි විජයබා පිරිවෙනෙහි ඉගැන්වූ විෂයයන් පිළිබඳව ඉතා විචිත්‍රවත් විස්තරයක් අඩංගු වේ. 'තොටගමුවේ භික්ෂූන්ගෙන් සමහරෙක් අභිධර්මයේ - නොතේරුණු තැන් විමසති. සමහරෙක් සූත්‍ර කට පාඩම් කරති. සමහර භික්ෂූහු කණ්ඩායම් වශයෙන් විනය නීති පද්ධති සාකච්ඡාවට භාජන කරන අතර ඒ පිළිබඳව උගත් ගුරුවරුන්ගේ සම්ප්‍රදායන් සහ අටුවා ටීකා විමසා බලයි. සාමණේර හිමිවරු වචන සම්බන්ධ කිරීම සහ එහි අර්ථයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ව්‍යාකරණ අධ්‍යයනයේ යෙදෙති. බොහෝ බ්‍රාහ්මණයන් සිව් වේදය අධ්‍යයනය කරති. කාලවර්ණ රෙදි කඩක් මත සිත්තිකටු නාමින් තාරකාවන්හි චලනය ගණනය කරන දෛවඥයන් පිරිසකි. මිනිසුන්ගේ රෝග නිවාරණ කිරීම සඳහා පැරැණි ඇදුරුවරුන් විසින් ප්‍රසිද්ධියට පත්කරන ලද වෛද්‍ය ග්‍රන්ථයන් පරිශීලනය කරන වෛද්‍ය ශිෂ්‍යයෝ ය. අනෙකුත් මිණුම් ක්‍රම, ඡන්ද ශාස්ත්‍රය, ව්‍යාකරණ, ඉගෙන ගන්නා අතර, තව සමහරු කාව්‍යයන් සහ සංස්කෘත, මගධ, එළු සහ දෙමළ බසින් නාට්‍යයන් ඉගෙන ගනිමින් සිටියහ.' යනාදී වශයෙනි.

විජයබා පිරිවෙනෙහි ඉගැන්වූ විවිධ විෂයයන්, විවිධ මූලාශ්‍රයන්ට අනුව පහත දක්වෙන අයුරින් සංක්ෂිප්තව දක්විය හැක.

අ. විනය, අභිධර්මය සහ සූත්‍ර

ආ. සකු, මගධ, එළු සහ ද්‍රවිඩ භාෂාවන්

ඇ. 'අට ආකාර ව්‍යාකරණ (ශ්‍රේෂ්ඨ විද්වතුන් අට දෙනකු විසින් එනම් ඉන්ද්‍ර, චන්ද්‍ර, කාශකෘෂ්ඨාන, අපිශාල, ශාකටායන, පනිනී, අමර සහ ජෛනේන්ද්‍රයන් විසින් නිර්මිත ව්‍යාකරණ)

ඈ. අටළොස් පුරාණ ලියවිලි (බ්‍රාහ්මන පද්ම, විෂ්ණු, ශිව, භගවත්, නාරද, මාර්කන්ද, අග්නි, භවිශ්‍යාත්, බ්‍රාහ්මවෛර්ත, ලිංග, වර්ණ, ස්කන්ධ, වාමන, කූර්ම, මත්ස්‍ය, සුපර්මා සහ බ්‍රාහ්මනන්ද)

ඉ. ෂඩ්භාෂා (සංස්කෘත, ප්‍රාකෘත, මගධ, සෞරසේන, පෛශාචි සහ අපභ්‍රංශ යන භාෂාවන්)

ඊ. චතුර්වේද (ඍග්, යජුර්, සාම සහ අථර්වන්)

උ. නක්ෂත්‍රය

ඌ. වෛද්‍ය විද්‍යාව එ. තර්ක විද්‍යාව.

ඒ. නාට්‍ය සහ පද්‍ය

ඔ. ද්‍රවිඩ, සොලී පාණ්ඩ්‍ය, ලාට, ගුජරාට, කුජ්වර, මහාරාෂ්ට්‍ර, තෙලිඟු, වඟු කේරල යනාදී භාෂා (එම රාජ්‍යවල අය මෙහි ඉගෙන ගත් හෙයින්)

විජයබා පිරිවෙනෙහි දහස් ගණනින් ශිෂ්‍යයන් අධ්‍යාපනය හැදෑරූ හෙයින් පිරිවෙනෙහි විවිධ අවශ්‍යතාවන් අසල ගම්වලින් සපයන ලදැයිද ඒ අනුව පසු කලෙක ගම්මාන හඳුන්වනු ලැබී යැයිද විශ්වාස කරනු ලැබේ. පොල්තෙල්, සීනි, මල්, බත් මැටි යනාදිය සැපයූ ගම්මාන පිළිවෙළින් තෙල්වත්ත, සීනිගම, මල්වැන්න, බද්දේගම සහ මැටිවල යන නම් ලැබූ බවයි. විජයබා පිරිවෙන් අධිපති ශ්‍රී රහල් හිමියෝ අති ශ්‍රේෂ්ඨ පඬිරුවනක් බැව් සුප්‍රසිද්ධය. රහල් හිමි එකල හැඳින්වූයේ ෂඩ් භාෂා පරමේශ්වර, (භාෂා හයක් මැනවින් දත්) ත්‍රිපිටක වාගීෂ්වරාචාර්ය, (ත්‍රිපිටකය පිළිබඳ හසල අවබෝධයක් ඇති සහ ඒ පිළිබඳව ආචාර්ය) සකල කලා සර්වඥ (සියලුම කලාවන්හි කෙළ පැමිණි) ආදී වශයෙනි. උන්වහන්සේ සතුව තිබූ එම ඥාන සම්භාරයට අමතරව පන්දහසකට අධික ශිෂ්‍යයන් ප්‍රමාණයක් කිසිදු කලබලයක් නොමැතිව පරිපාලනය කිරීමට ද උන්වහන්සේ අති දක්ෂ වූහ. විජයබා පිරිවෙනෙහි රහල් හිමි යටතේ උගත් භාරතීය බමුණකු වූ ශ්‍රී රාමචන්ද්‍ර කවි භාරතී ද රහල් හිමි අගයමින් ග්‍රන්ථ ලියූ කෙනෙකි. මෙම පීඨයේ සිසුන් තුළ තිබූ විනය සහ හික්මීමෙහි උසස් බව ගැන අමුතුවෙන් කිව යුතු නොවේ. අනිකුත් සමකාලීන අධ්‍යාපන පීඨයන් අතර තිබූ සුහද තරඟකාරීත්වය ද මෙම තත්ත්වය ඇති කරලීමට යාමට ඉවහල් වූවා යැයි සිතිය හැක.

ගිරා සංදේශය, විජයබා පිරිවෙන් භූමිය පිළිබඳව අතිශය සිත් ගන්නා අයුරින් විස්තර කර ඇත්තේ මෙසේය. 'පිරිවෙනට අවතීර්ණ වන මාර්ගය පිරිසිදු සුදු වැලි වලින් සැදුණු අතර එය පලතුරු උයන්, පොල් අරුප්පාවන්, මල් සහ අනෙකුත් විසිතුරු ගස් අතරින් දිවෙයි. ආරාමය සමීපයේ අවට සල්, කොලොම්, සපු, නා, කිනිහිර, පළොල්, ගොඩ, එරබදු, අඹ, සීනිඳු සහ ඇසල ගසින්ද, දෑසමන්, නෙළුම් සහ කටරොළු මල්වලින්ද ගැවසී ගත් අතර ඒ මල් අවට මීමැසිපොදි ගුම් නඳදෙද්දී, කෝකිලයන් ගී ගායනා කරද්දී වදුලෙහි සෙවනෙහි මොනරුන් රඟ දෙද්දී ලේනුන් පිරිසේ අවට දුව පැන යන්නාහ.' යනාදී වශයෙනි. අද විදේශීය රටවල විශ්වවිද්‍යාල භූමියන්හි තිබෙන අලංකාර බව, පිරිසිදු බව සහ ක්‍රමවත් බව අගයමින් කතා කරන අපගේ දේශීය හිතවතුනට පහළොස්වැනි සියවසෙහි අපේ රටේ සරසවියක භූමියේ වූ එම අලංකාර, විචිත්‍ර දසුන් පිළිබඳ දැනගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

විජයබා පිරිවෙනට අමතරව, පහළොස්වැනි ශතවර්ෂයේ, තවත් බොහෝ අධ්‍යාපනික ආයතනයන් විය. ඒවා නම් පැපිලියාන සෙල්ලිපිවල සඳහන් සුනේත්‍රාදේවි පිරිවෙන, හංස සංදේශයෙහි සඳහන් කැරගල පද්මාවතී පිරිවෙන, බුද්දජ්සාදිනියෙහි සඳහන් ලංකා සෙනරත් පිරිවෙන, වනමලා සහ කිත්සිරි මෙවන් කැලණි ලිපියේ සඳහන් ගඩාර පිරිවෙන, වනමාලාවේ ශ්‍රී රාමචන්ද්‍ර කවි භාරතී සඳහන් කර ඇති ශ්‍රී නිවාස පිරිවෙන, කල්‍යාණි සෙල්ලිපියේ සඳහන් පංචමූල පිරිවෙන, අරම්කැලේ ලිපියේ සඳහන් එරබත්තොට ධර්මරජ පිරිවෙන යනාදී වශයෙනි. මේ සියල්ලෙන්ම ප්‍රමුඛ ස්ථානය වැජඹුණේ සිරි රහල් මා හිමිපාණන් අධිපතිත්වය දැරූ ජයබා පිරිවෙන බැව් නොරහසකි.

පහළොස්වැනි සියවසේ විජයබා පිරිවෙන වැනි ශ්‍රේෂ්ඨ අධ්‍යාපන ආයතන බිහි වූයේ ද සම්භාවනීය සාහිත්‍ය කෘතීන් රචනා වූයේ ද සවැනි පරාක්‍රමබාහු රජු විසින් වන්නි 18 ජයගෙන සපුමල් කුමරුගේ නායකත්වයෙන් යුත් සේනාව පිටත්කොට, යාපනය ජයගෙන රට එක්සේසත් කිරීමෙන් පසුව එළැඹුණු සාමකාමී වාතාවරණය හේතුකොටගෙනය.

ඉතිහාසයට අනුව පරාක්‍රමබාහු රජුගේ එම ද්‍රවිඩ ආක්‍රමණිකයන් මර්දනය කොට රට එක්සේසත් කිරීමේ ව්‍යායාමයට සමස්ත ජාතියම දායක වූ අතර මුළු ජාතියේ ම අවධානය යොමුව තිබුණේ එම කර්තව්‍යයට හා ඊට අදාළ ක්‍රියාදායකත්වය. මන්ද, චරිත්වර චෝල, පාණ්ඩ්‍ය ආක්‍රමණිකයන් විසින් අප මාතෘභූමියට කරන ලද මහත් වූ විනාශ පිළිබඳව ද, එවකට යාපනයේ සිට ව්‍යාප්ත කරමින් තිබූ ආර්ය චක්‍රවර්තිගේ අතිකෲර දූෂිත පාලනය පිළිබඳව ද, එවන් ! සතුරෙක් විනාශ කර රට එක්සේසත් නොකළහොත් සිදු විය හැකි විනාශය, පිළිබඳවද ඔවුන් හොඳින් අවබෝධ කොට තිබූ බැවිනි. රජු කෙරෙහි ඇති භියටත් වඩා රට එක්සේසත් කරවීමට ගන්නා රජුගේ ප්‍රයත්නයට ඇති ගෞරවය හා පක්ෂපාතීකම හේතුකොටගෙන කිසිවෙක් එම ක්‍රියාදාමයට අල්පමාත්‍රයක හෝ අවහිරයක් කොට යුද වැදී සිටින රජුගේ අවධාන සුළු වශයෙන් හෝ වෙනත් පැත්තකට යොමු කිරීමට දායක ව කිසිවක් නොකළහ. ඒ වනාහී තම දේශය පිළිබඳ වූ දැඩි ස්නේහය සහ ප්‍රේමය නිසාම ජනිත වන ජනතා ආකල්පයක් බැව් අමුතුවෙන් කිව යුතු නොවේ.

වර්තමානයේදී රුදුරු ත්‍රස්තවාදියා පරාජය කොට රට එක්සේසත්කිරීමේ යුද්ධමය ක්‍රියාවලියට අප රට අවතීර්ණ වී ඇති අතර, ජයග්‍රහණයේ අභිමුඛයට පැමිණ, ඉතාම තීරණාත්මක අවසාන සටනක අද රණවිරුවන් නියැළී සිටී. මෙවන් වූ සංවේදී මොහොතක රටේ අනාගතයේ ජීවනාලිය බඳු විශ්වවිද්‍යාලවල උගත් සිසු සිසුවියන් කළ යුත්තේ අනවශ්‍ය ගැටුම් ඇති කොට විශ්වවිද්‍යාල වසා දමා අධ්‍යාපනය කඩාකප්පල් කරමින් රජයට තවත් ප්‍රශ්නයක් ඇති කිරීම නොව අද ජාතිය හමුවේ තිබෙනා මෙම ප්‍රධාන ප්‍රශ්නය එනම්, ත්‍රස්තවාදීන්ට එරෙහිව කරන යුද්ධය කඩිනමින් නිම කිරීමට ඇවැසි සහාය සෘජුව නොහැකි නම් වක්‍රව හෝ ලබාදීමයි. එසේ සහාය දිය හැකි එක් ක්‍රමයක් නම් මෙවන් අවස්ථාවක අනවශ්‍ය ප්‍රශ්න ඇති නොකර සිටීමයි. විශ්වවිද්‍යාල වසා දැමීමෙන් හෝ එය තුළ ගැටුම් ඇති කිරීමෙන් හෝ ත්‍රස්තවාදීන්ට එරෙහිව කරන යුද්ධයට හෝ රණවිරුවන්ට කිසිසේත්ම බලපෑමක් ඇති නොවන බව අපි දනිමු. නමුත් මෙතැනදී ඉස්මතු වන්නේ රට මුහුණපා තිබෙන මෙම බැරෑරුම් අවස්ථාවේදී සරසවි සිසුන් ද ඇතුළු ව රටේ පොදු ජනතාව විසින් ඒ පිළිබඳ දක්වන ආකල්පයයි. පෙර රජ දවස මෙන් එවන් වූ ආකල්පයක් හදවත් තුළ ජනිත වන්නේ රට ජාතිය කෙරෙහි ඇති ස්නේහය හා භක්තිය නිසාය. රටේ ජීවන වියදම කෙතරම් ඉහළ ගියද අද ත්‍රස්තයාට එරෙහිව ගෙන යන යුද්ධයට, රජයට සහාය දෙන දුගී දුප්පත් ජනතාව ඊට කදිම නිදර්ශනයකි. එම දෘෂ්ටි කෝණයෙන් බලන කල මෙවන් වූ වාතාවරණයක් තුළ අද විශ්වවිද්‍යාල තුළ ගැටුම් ඇති කොට ඒවා වසා දමා සිසුන්ගේ අධ්‍යාපනයට අවහිර කරමින් රජයට ප්‍රශ්නයක් ඇති කරන යම් පිරිසක් වෙතොත් ඔවුන් කුමන ගණයට වැටෙන්නේ දැයි කෙනකුට අවබෝධ කර ගැනීමට අපහසු නොවේ.

ත්‍රස්තවාදියා අන්ත පරාජයකට ලක්කොට රට එක්සේසත් කරමින් ජයග්‍රහණය ලබන දිනය වැඩි ඈතක නොවේ. ඊට පසුව හා ඒ හා සමානව අද රට සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියට ද අවතීර්ණ වී ඇත්තෙමු. ඉන්පසු එළැඹෙන සාමකාමී පරිසරය තුළ පරාක්‍රමබාහු රජ කල මෙන් රට සුභිත මුදිත වනු ඇත. එනමුත් අප රට තුළ ඇති විශ්වවිද්‍යාල විජයබා පිරිවෙන මෙන් ජාත්‍යන්තර කීර්තියට පත්වන ආයතන බවට පත් කිරීමට නම් ක්‍රමානුකූලව, නියමිත කාලසටහනකට අනුව අධ්‍යාපන කටයුතු සිදු කිරීමට නම්, විශ්වවිද්‍යාල පාලකයන් සිසුන්ගේ සාධාරණ ගැටලුවලට විසඳුම් දිය යුතු සේම සිසුන් ද අනිවාර්යයෙන්ම දේශ හිතෛෂී විය යුතුය. තමාට නොමිලයේ උසස් අධ්‍යාපනය ලබාදීමට බදු ගෙවන රටේ ජනතාවට, මාතෘ භූමියට ගෞරවය කළ යුතුය. දේශහිතෛෂී නොවන සිසුන්හට විශ්වවිද්‍යාල අධ්‍යාපනයට පෙර තම මාතෘභූමියට ආදරය කිරීමට ඉගැන්විය යුතුය. මවුබිමට ආදරය කිරීමට නොහැකි, දශක තුනකට අධික කාලයක් තිස්සේ පැවතෙන යුද්ධයේ තීරණාත්මක අදියරයකට පැමිණ ඇති මේ අවස්ථාවේ අනවශ්‍ය ගැටලු ඇති කරමින් විශ්වවිද්‍යාලයේ අනෙක් අසරණ සිසුන්ගේ ද අධ්‍යාපනය කඩාකප්පල් කිරීමට මාන බලන අය වෙතොත් උන් සැම සරසවි භූමියෙන් පන්නා දැමිය යුතුය. එද විජයබා පිරිවෙනාදී අධ්‍යාපන පීඨයන්ගෙන් බිහිවූවාක් මෙන් උගත් පරපුරක් අද විශ්වවිද්‍යාල තුළින් මවුබිමට දායාද කළ හැක්කේ එවන් වූ පියවරක් ගැනීම තුළින් පමණි.

සියවස් පහට පෙර අප දත් 'තොට   ගමුවේ'
සුපතල 'විජයබා පිරිවෙන' මට   සිහිවේ
පන්දහසකට වැඩි පිරිසක් තුරු   ගොමුවේ
සිප්සත උගත්පුරු අප සැම දන   යුතුවේ

උදයේ හවස මුනිඳුන් වැඳ පුද   ගෙන
ඇදුරන් කෙරෙහි නිති බැති සිත් දරා   ගෙන
උන් පොත් කලා හැම දන සිත් දිනා   ගෙන
මැනවින් තුටින් යස මිතුරන් විලා   සෙන

සරසවි සිසුන්ගේ අද ඇති ගැටලු   සැම
විසඳා දුරලා අසමගිකම් තිබෙන   එම
උන් හද ජනිත කළ හොත් මවුබිමට   'පෙම'
යොහොමට අපූරුද හෙට අප ජනිත   බිම

රියර් අද්මිරාල් සරත් වීරසේකර